# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2474/25 - 2026 පෙබරවාරි මස 03 වැනි අඟහරුවාදා - 2026.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ (2) වගන්තිය යටතේ මීනුවන්ගොඩ නගර සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මීනුවන්ගොඩ නගර සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66ආ (2) වන වගන්තිය යටතේ තනතුර දැරූ සභාපති වන වික්‍රම ආරච්චිගේ අසේල වික්‍රමාරච්චි අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මීනුවන්ගොඩ නගර සභාවේ සභාපති පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ආරච්චි අප්පුහාමිලාගේ ජානක සෙනවිරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

මීනුවන්ගොඩ නගර සභාවේ තේරීම්භාර නිලධාරී විතාන අප්පුහාමිල්ලාගේ රවීන්ද්‍ර වික්‍රමසිංහ වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66ආ (2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ආරච්චි අප්පුහාමිලාගේ ජානක සෙනවිරත්න, මීනුවන්ගොඩ නගර සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**ඩබ්ලිව්. ඒ. රවීන්ද්‍ර වික්‍රමසිංහ,**
තේරීම්භාර නිලධාරී,
මීනුවන්ගොඩ නගර සභාව.

2026 පෙබරවාරි මස 02 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

EOG 02 - 0024

1A - PG 7513 — 09 (2026/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*